## <u>දේපල ණය ලබා ගැනීම සඳහා උපදෙස්</u>

01. දේපල ණය ලබාගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු සුදුසුකම්
    - රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විය යුතුයි
    - විශ්‍රාම වැටුප් හිමි වර්ෂ 05 ක සේවා කාලයක් සහිත තනතුරේ ස්ථිර කර තිබිය යුතුයි

02. දේපළ ණය අයදුම්පතට අමතරව අවශ්‍යය ලේඛන
    - දේපල ණය ලබා ගන්නා ඉඩමට අදාල ඔප්පුවේ සත්‍ය පිටපතක් බවට සහතික කළ පිටපතක්
    - දේපල ණය ලබා ගන්නා ඉඩමට අදාළ සැලසුමේ සත්‍ය පිටපතක් බවට සහතික පිටපතක්
    - වැටුප් සකසන අංශයෙන් සහතික කල ආසන්නතම මාසයේ වැටුප් විස්තර 03 ක් (එකම මාසයේ)

03. අයදුම්පත සම්පූර්ණ කිරිම සඳහා උපදෙස්
    - මීට ප්‍රථම දේපල ණය ලබාගෙන නොමැති බවට සහතිකය පෞද්ගලික ලිපිගොනුවෙන් ලබා ගත යුතුයි
    - ආවරණ ලිපිය ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුයි
    - දිවුරුම් ප්‍රකාශය ණයකරු විසින් සාමදාන විනිශ්වයකාරවරයෙකු ඉදිරියේ රු. 50.00 මුද්දරයක් මත අත්සන් තබා ඉදිරිපත් කල යුතුයි.
    - 26 පරිශිෂ්ඨයේ අංක 1 සිට10 දක්වා ණයකරු විසින් සම්පූර්ණ කර අත්සන් යෙදිය යුතුයි.
    - 26 පරිශිෂ්ඨයේ ඉතිරි කොටස පහත සඳහන් පිළිවෙලින් සම්පූර්ණ කරගත යුතුයි
        - අංක 1, 2, 3 පෞද්ගලික ලිපි ගොනුවෙන්
        - අංක 04 විනය ශාඛාවෙන්
        - අංක 05 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් අංශයෙන්
        - අංක 06 ණයකරුගේ වැටුප් සකසන ඒකකයෙන්
    - දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිත කොටසේ ණය මුදල ලබා ගන්නා බැංකුවේ නිවැරදි ලිපිනය සඳහන් කළ යුතුයි
    - ඉඩමක් මිලදී ගන්නේ නම් 30 පරිශිෂ්ඨය අදාළ ඉඩමේ හිමිකරු විසින් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුයි.

සැ.යු.

ආයතන සංග්‍රහයේ 11:10:1:2 අනුව ණය මුදල ගණනය කිරිමේදි නිලධරයාගේ වැටුපෙන් අවකරණය කරන ලද බැඳීම්ගත අඩුකිරිම් හා වෙනත් අඩුකිරිම් සැලකිල්ලට ගනු ලබයි.

නිලධාරියෙකුට සිය සේවා කාලය තුල දේපල ණය ලබා ගත හැකි වන්නේ එක් වරක් පමණි.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 15/2007 (IV) අනුව දේපල ණය පොළි මුදල් 2021.01.01 දින සිට පහත පරිදි ගණනය කරනු ලබයි.

| ණය මුදල (රු.) | නිලධාරියා ගෙවිය යුතු පොළි ප්‍රතිශතය | රජය විසින් ගෙවිය යුතු පොළි ප්‍රතිශතය | බැංකුවට ගෙවිය යුතු මුළු පොළී ප්‍රතිශතය |
|---|---|---|---|
| 500,000.00 දක්වා | 3.0% | 5.5% | 8.5% |
| 500,001 සිට 1,000,000 දක්වා | 6.0% | 2.5% | 8.5% |

| | | | |
|---|---|---|---|
| **1,000,001 සිට 3,000,000.00 දක්වා** | **7.0%** | **2.0%** | **9.0%** |